**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

අදියර I විභාගය - 2026 ජනවාරි

## (103) ආර්ථික විද්‍යාව

(Economics)

ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සඳහා උත්තර සැපයීමේදී බොහෝ විභාග අයදුම්කරුවන් ප්‍රමාණාත්මක මට්ටමින් උත්තර සපයා තිබූ බව පෙනේ. කෙසේවෙතත්, සමස්තයක් වශයෙන් ගත් කළ ඇතැම් ප්‍රශ්න සඳහා බොහෝ අයදුම්කරුවන් සපයා තිබූ උත්තරවල යම් යම් අඩුපාඩුකම් දක්නට ලැබුණි.

ඒ අනුව උත්තරපත් පරීක්ෂා කිරීමේදී ඒ පිළිබඳව උත්තර පත්‍ර පරීක්ෂකවරුන්ගේ නිරීක්ෂණයන් පහත දැක්වේ:

## A කොටස

### ප්‍රශ්න අංක **01**

ආර්ථික විද්‍යා විෂය නිර්දේශයෙහි පුළුල් පරාසයක් ආවරණය වන පරිදි මෙම කොටස සකස්කර ඇත. මූලික ආර්ථික විද්‍යාත්මක න්‍යායන් සහ සංකල්ප පදනම් කරගනිමින් මෙය සැකසූ වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න ඇතුලත් මෙම ප්‍රශ්නය අනිවාර්ය ප්‍රශ්නයකි.

ප්‍රශ්න අංක **1.1** සිට **1.10** දක්වා බහුවරණ ප්‍රශ්න දහයකින් සමන්විත වේ.

ප්‍රශ්න අංක **1.11** සිට **1.12** දක්වා ප්‍රශ්න වලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි උත්තර ලිවීමට තිබූ අතර ප්‍රශ්න අංක **1.13** සිට **1.14** දක්වා ප්‍රශ්න වලට ඇති එක් ප්‍රකාශයන් සත්‍ය හෝ අසත්‍ය යන්න ප්‍රකාශ කිරීම ප්‍රශ්න අංක **1.15** සිට **1.20** දක්වා ප්‍රශ්නවලට උත්තර, ප්‍රශ්න අංකයද සමඟ පිළිතුරු පොතේ ලිවීමත් මෙම කොටස මගින් අපේක්ෂා කෙරේ.

මෙම ප්‍රශ්ණය යටතේ බොහෝ අයදුම්කරුවන් සාර්ථක ලෙස ලකුණු ලබාගෙන තිබුණු අතර, ඇතැම් අයදුම්කරුවන්ගේ උත්තරවල දුර්වලතා තිබුණි. මේ අනුව පොදුවේ දැකිය හැකි දුර්වලතා පහත පරිදි වේ.

**1.1** සූක්ෂම ආර්ථික විද්‍යාවට අයත් නිවැරදි ප්‍රකාශය ලෙස තුන්වන වරණය වන පාරිභෝගික හැසිරීම් පිළිබඳව අධ්‍යනය කිරීම යන්න බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.2** ව්‍යවසායකත්වය යන නිෂ්පාදන සාධකයට ලැබෙන ප්‍රතිලාභ අසා තිබූ මෙම ප්‍රශ්නයට ලාභය ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

**1.3** නිෂ්පාදන අතිරික්තය ගණනය කිරිමට තිබූ මෙම ප්‍රශ්නයට රු.1,800/- ක් ලෙස බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

**1.4** එක් විකුණුම්කරුවෙකු සිටින වෙළෙඳපොළ ව්‍යුහය ඒකාධිකාරය ලෙස බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**1.5** නිෂ්පාදන හැකියා මායිමේ උපකල්පනයක් පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට උත්තර ලෙස සලකා බලන කාල පරිච්ඡේදය යන්න බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.6** පාරිභෝගික ස්වාධිපත්‍යයක් පැවතීම විධානගත ආර්ථික පද්ධතියක ලක්ෂණයක් නොවන බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.7** උපේක්ෂා වක්‍ර පිළිබඳ අසා ඇති මෙම ප්‍රශ්නයට බොහෝ අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා නොතිබුණි. උපේක්ෂා වක්‍ර පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව පැහැදිලි වේ.

**1.8** අනුපූරක භාණ්ඩවල මිල, පාරිභෝගික ආදායම, ආදේශක භාණ්ඩවල මිල යන ආදී සියලුම කරුණු ඉල්ලුමේ තීරකයන් වන බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.9** පාරිභෝගික ආදායම වැඩිවීම නිසා ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වන බව බොහෝ අයදුම්කරුවන් සාර්ථකව හඳුනාගෙන තිබුණි.

**1.10** 2024 වර්ෂය සඳහා වන ශ්‍රී ලංකා මහා බැංකුවේ වාර්ෂික සමාලෝචනයට අනුව, 2024 වර්ෂයේ ශ්‍රී ලංකාවේ ඒක පුද්ගල ආදායම ඇමෙරිකානු ඩොලර් 4,516 ක් බව බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.11** ආවස්ථික පිරිවැය යනු යම්කිසි තෝරා ගත් තීරණයක් වෙනුවෙන් කැප කරන ලද ඊළඟ හොඳම විකල්පයේ වටිනාකම ලෙස නිවැරදිව උත්තරය සපයා ලකුණු ලබාගත් අයදුම්කරුවන් බොහෝ වේ.

**1.12** ආන්තික නිෂ්පාදන වක්‍රය, සාමාන්‍ය නිෂ්පාදන වක්‍රයේ උපරිම ලක්ෂයේදී සාමාන්‍ය නිෂ්පාදන වක්‍රය ඡේදනය වන බව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**1.13** "නිෂ්පාදනයේ ප්‍රශස්ත මට්ටමේදී ආන්තික ආදායම ආන්තික පිරිවැයට සමාන වේ" යන්න සත්‍ය බව බොහෝ අයදුම්කරුවන් හඳුනාගෙන තිබුණි.

**1.14** ඒකාධිකාරී තරඟයේදී කෙටි කාලයකදී පමණක් ආයතන විසින් ප්‍රමාණික ලාභ උපයන බව අසත්‍ය ප්‍රකාශයක් බවට බොහෝ අයදුම්කරුවන් නිවැරදිව හඳුනාගෙන තිබුණි.

**1.15** ආර්ථික භාණ්ඩවල ලක්ෂණ දෙකක් සාර්ථකව බොහෝ අයදුම්කරුවන් සඳහන් කර තිබුණි.

**1.16** ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනය යනුවෙන් අදහස් කරන්නේ කුමක්ද යන්න බොහෝ අයදුම්කරුවන් සාර්ථකව කෙටියෙන් පැහැදිලි කර නොතිබුණි. මෙම සංකල්පය පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම දුර්වල බව පැහැදිලි වේ.

**1.17** මුදලට ඇති ඉල්ලුම සඳහා ඇති චේතනාවන් පිළිබඳ දැනුම මැනීමට දී ඇති මෙම ප්‍රශ්නයට නිවැරදි අවබෝධයකින් උත්තර සපයා තිබුණේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි. සමහර අයදුම්කරුවන් මුදලට ඇති ඉල්ලුම සඳහා ඇති චේතනාවන්, මුදලේ කාර්යයන් සහ මුදල්වල ලක්ෂණ සමග පටලවාගෙන සඳහන් කර තිබුණි.

**1.18** මුළු උපයෝගීතාවය සහ ආන්තික උපයෝගීතාවය අතර වෙනස පිළිබඳ සිසුන්ගේ අවබෝධය පහල මට්ටමක පවතින බව ඔවුන් ඉදිරිපත් කරන ලද පිළිතුරු ඔස්සේ තහවුරු විය. සමහර අයදුම්කරුවන් මේ සඳහා මුළු නිෂ්පාදනය සහ ආන්තික නිෂ්පාදනය අතර වෙනස සඳහන් කර තිබුණි.

**1.19** මානව සංවර්ධනයේ පැතිකඩ පිළිබඳව සිසුන්ගේ දැනුම ප්‍රමාණවත් නොවන බව ලියා ඇති උත්තර මගින් පැහැදිලි වේ.

**1.20** ශ්‍රී ලංකා ආර්ථිකයේ මෑත කාලීන ප්‍රවණතා පිළිබඳ ව සමහර අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණද, සමහර අයදුම්කරුවන් සාර්ව ආර්ථික අරමුණු පිළිබඳව ලියා ඇත.

## B කොටස

(එක් කොටසකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 4 කි.)

### ප්‍රශ්න අංක 02

**(a)** **(i)** නිෂ්පාදන සාධක හතර පිළිබඳව අසා තිබූ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් බොහෝමයක් සාර්ථකව උත්තර සපයා තිබුණි.

**(ii)** ආවස්ථික පිරිවැය ශූන්‍ය වන අවස්ථා සඳහන් කරන ලෙසට අසා තිබූ මෙම ප්‍රශ්නයට ද බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබුණි.

**(b)** Qd = 200 - 10p සහ Qs = 40 + 30p ලෙස දෙන ලද ඉල්ලුම් සහ සැපයුම් සමීකරණ ආධාරයෙන් වෙළඳපළ සමතුලිත මිල සහ ප්‍රමාණය බහුතරයක් අයදුම්කරුවන් නිවැරදිව ගණනය කර මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**(c)** මිල සැපයුම් නම්‍යතා තීරක පිළිබඳව අසා ඇති මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සාර්ථකව පිළිතුරු සපයා තිබුණේ නැත. සමහර අයදුම්කරුවන් ප්‍රශ්නය නිවැරදිව අවබෝධ කර ගැනීමෙන් තොරව සැපයුමෙහි තීරක සඳහන් කර ඇති අතර, ඉල්ලුම් නම්‍යතාව තීරණය වීම කෙරෙහි බලපාන සාධකද සඳහන් කර ඇත.

### ප්‍රශ්න අංක 03

**(a)** රජය විසින් භාණ්ඩයක් සඳහා ඒකක බද්දක් පැනවීමේ ප්‍රතිවිපාක ප්‍රස්ථාරයක් භාවිතයෙන් නිවැරදිව පැහැදිලි කිරීම සිදුකර තිබුණේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි.

බොහෝ අයදුම්කරුවන් සැපයුම් වක්‍රය නිවැරදිව ඇඳ, බද්ද නිසා වක්‍රය වමට විතැන් කිරීමට අපොහොසත් වී ඇත. සමහර අයදුම්කරුවන් ඉල්ලුම් වක්‍රය නිවැරදිව ඉදිරිපත් කර තිබුණේ නැත.

සැපයුම් වක්‍රය නිවැරදිව නිර්මාණය නොකිරීම නිසා වෙන් කළ මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගැනීමට අයදුම්කරුවන් අපොහොසත් වී ඇත.

**(b)** දිගු කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය පිළිබඳ බොහෝ අයදුම්කරුවන්ගේ අවබෝධය ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. දිගුකාලීන නිෂ්පාදන ක්‍රියාවලියේ ලක්ෂණ දෙකක් සඳහන් කරන ලෙස විමසා තිබුණද බොහෝ අයදුම්කරුවන් සඳහන් කර තිබුණේ එක් ලක්ෂණයක් පමණි.

**(c)** කතිපයාධිකාරී වෙළඳපළක ලක්‍ෂණ නිවැරදිව සඳහන් කර තිබුණේ අයදුම්කරුවන් කිහිප දෙනෙකු පමණි. බොහෝ අයදුම්කරුවන් පූර්ණ තරඟකාරී සහ ඒකාධිකාරී වෙළඳපොළවල ලක්ෂණ පටලවාගෙන ලියා තිබුණි. සමස්තයක් ලෙස සැලකිය යුතු අයදුම්කරුවන් ප්‍රමාණයක් මෙම ප්‍රශ්නයට සාර්ථකව පිළිතුරු ලියා නොතිබුණි.

## ප්‍රශ්න අංක 04

**(a)** බොහෝ අයදුම්කරුවන් වාණිජ බැංකුවක කාර්යයන් නිවැරදිව සඳහන් කර ඇති අතර සමහර අයදුම්කරුවන් වාණිජ බැංකුවක කාර්යයන් වෙනුවට මහ බැංකුවේ කාර්යයන්ද ලියා තිබුණි.

**(b)** මෙම ප්‍රශ්නය සඳහා බොහෝ අයදුම්කරුවන් සාර්ථකව උත්තර සපයා තිබූ බව නිරීක්ෂණය විය. බහුතරයක් අයදුම්කරුවන් මිල මට්ටම යන්න පැහැදිලි කොට තිබුණත්, මිල මට්ටම සහ පොලී අනුපාතය අතර සම්බන්ධතාවය පැහැදිලි කිරීමට සමත්ව තිබුණේ නැත.

**(c)** ගුණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ පිළිබඳව අඩු අවබෝධය නිසා බොහෝ අයදුම්කරුවන් ගුණාත්මක උපකරණ වෙනුවට මහ බැංකු පොලී අනුපාතිකය, ව්‍යවස්ථාපිතය සංචිත අනුපාත, විවිධ වෙළඳපොළ කටයුතු වැනි ප්‍රමාණාත්මක මූල්‍ය ප්‍රතිපත්ති උපකරණ පැහැදිලි කර තිබුණි.

## ප්‍රශ්න අංක 05

**(a)** බොහෝ අයදුම්කරුවන් නිවැරදිව ආවස්ථික පිරිවැය ගණනය කර, ආවස්ථික පිරිවැය අඩු රටට සාපේක්ෂ වාසිය හිමි බව හඳුනාගෙන මුළු ලකුණු ප්‍රමාණයම ලබා ගන්නා ලදී.

සමහර අයදුම්කරුවන් ආවස්ථික පිරිවැය ගණනය කර, සාපේක්ෂ වාසිය හිමි රට මාරුකර ලියා ඇත. අයදුම්කරුවන් වැරදියට ගණනය කිරීම් සිදුකොට තිබුණි.

**(b)** නම්‍ය සහ ස්ථාවර විනිමය අනුපාත පිළිබඳව අයදුම්කරුවන්ගේ දැනුම ඉතා අඩුම මට්ටමක පවතින බව නිරීක්ෂණය විය. බොහෝ අයදුම්කරුවන්ට නම්‍ය යනු වෙනස් වන සහ "ස්ථාවර" යනු වෙනස් නොවන ලෙස වචනයේ අර්ථය පමණක් ගෙන පිළිතුරු සපයා ඇත.

බොහෝ දෙනෙක් මෙම සංකල්පය අතර වෙනස හඳුනාගෙන පැහැදිලි කිරීමට සමත් විය.

**(c)** ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල අවප්‍රමාණයවීම පාලනය කිරීමට ගත හැකි පියවරයන් සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් පමණක් පැහැදිලි කර තිබුණි.

සමහර අයදුම්කරුවන් අපනයන දිරිගැන්වීම් සහ ආනයන අධෛර්යමත් කිරීම වැනි පියවර දෙකක් පමණක් සඳහන් කර ඇති අතර ඒවා පැහැදිලි කර නොමැත.

# C කොටස

## ප්‍රශ්න අංක 06

**(A)** බොහෝ අයදුම්කරුවන් සාර්ව ආර්ථික අරමුණු නිවැරදිව සඳහන් කර මුළු ලකුණු ලබා ගැනීමට සමත්විය.

**(B)** ජාතික ආදායම් ගිණුම්කරණයේ ප්‍රවේශ තුන ආදායම්, වියදම් සහ නිමැවුම් ලෙස සඳහන් කර බොහෝ අයදුම්කරුවන් මුළු ලකුණු ලබා ගන්නා ලදී.

**(C)** බොහෝමයක් අයදුම්කරුවන් (a) වෙළඳපොළ මිලට දළ දේශීය වියදම (b) වෙළඳපොළ මිලට දළ දේශීය නිෂ්පාදිතය (c) වෙළඳපොළ මිලට ශුද්ධ ජාතික නිෂ්පාදිතය නිවැරදිව ගණනය කර තිබුණි. සමහර අයදුම්කරුවන් ශුද්ධ ජාතික නිෂ්පාදිතය ගණනය කිරීමේදී විදේශ ශුද්ධ ප්‍රාථමික ආදායම ගැලපීමේදී (+) හෝ (-) අගය නොසලකා තිබූ අතර ඇතැම් අයදුම්කරුවන් එය අඩු කර තිබුණි.

**(D)** මූලික මිල පිළිබඳ සාර්ථකව පිළිතුරු සපයා තිබුනේ අයදුම්කරුවන් අතලොස්සක් පමණි. මූලික මිල පිළිබඳ දැනුම අයදුම්කරුවන්ට නොමැති බව මෙයින් පැහැදිලි වේ.

**(E)** මධ්‍යස්ථ අයදුම්කරුවන් ප්‍රමාණයක් පමණක් ඍජු බදු සහ වක්‍ර බදු අතර වෙනස පැහැදිලිව සඳහන් කර තිබුණි. සමහර අයදුම්කරුවන් ඍජු බදු යනු ඍජුවම අය කරගන්නා බදු ලෙස සහ වක්‍ර බදු යනු වක්‍රාකාරයෙන් අය කර ගන්නා බදු ලෙස වචනයේ අර්ථයෙන් ගෙන පිළිතුරු සපයා තිබුණි.

\- - -

**<u>විභාග අයදුම්කරුවන්ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමු කළ යුතු පොදු කරුණු:</u>**

(1) විෂය නිර්දේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා ප්‍රශ්නයෙන් අසා ඇති උත්තර පිළිබඳව නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම්/විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළ යුතු ක්‍රියා පරික්ෂා ලැයිස්තුව ප්‍රශ්න පත්‍රයටම අමුණා ඇත. වාස්තවික ප්‍රශ්න හැර අන් සෑම ප්‍රශ්නයක්ම කළයුතු ක්‍රියාවකින් යුක්ත වේ. එහි දී ඇති අර්ථකථනවලට අනුකූලවෙමින් උත්තර ලියන්න.

(4) මෙම විෂයට අදාළ ස්ව-අධ්‍යයන පාඩම් මාලාව, ග්‍රන්ථ, අත්පොත් ලිපි, සඟරා, මහ බැංකු වාර්තා ආදිය මැනවින් පරිශීලනය කිරීම.

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගැනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ආර්ථික විද්‍යා සංකල්ප පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුලින් එකිනෙක සංකල්ප අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර බාරදීමට පෙර ප්‍රශ්න අංක ආදිය නිසි පරිදි යොදා තිබේදැයි නැවත පරික්ෂා කර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත්වීම.

\- * * * -